# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2301/61 – 2022 ඔක්තෝබර් 15 වැනි සෙනසුරාදා – 2022.10.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2018/197.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරිය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.03.22 දිනැති හා අංක 2115/50 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.03.14 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 03, ඇලෝයි මාවත, අංක 06 හි පිහිටි ලංකා වතු සේවා සංගමය සහ බදුල්ල, හිඟුරුගම සංකීර්ණය හි පිහිටි මඩුල්සිම ප්ලාන්ටේෂන් පී. එල්. සී අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.09.09 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 ඔක්තෝබර් මස 03 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කාර්මික අධිකරණයේ දී ය.**

ලංකා වතු සේවා සංගමය,
අංක 06, ඇලෝයි මාවත,
කොළඹ 03.

*පළමු පාර්ශ්වය*

නඩු අංකය: A 27/ 2019

1R /COM/02/2018/197

සහ

මඩුල්සිම ප්ලාන්ටේෂන් පී. එල්. සී.,
හිඟුරුගම සංකීර්ණය,
බදුල්ල.

*දෙවැනි පාර්ශ්වය*

*අතර ඇති කාර්මික ආරවුල*

**ප්‍රදානයයි**

1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 ( 1968 අංක 37 දරණ කාර්මික ආරවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරණ පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වගන්තියෙන් කම්කරු හා වෘත්තීය සබඳතා අමාත්‍යවරයාට පැවරී ඇති බලතල අනුව අමාත්‍යවරයා විසින් ඉහත සඳහන් පාර්ශවකරුවන් අතර වූ කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරුවෙකු ලෙස 2019.03.14 වැනි දින මා පත් කරන ලදී.

කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් 1R/COM/02/2018/197 හා 2019.03.14 වන දින යටතේ ගොණු කරන ලද ලේඛණය අනුව

ඉහත සඳහන් පාර්ශවකරුවන් අතර ඇති ආරවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

“ මඩුල්සිම ප්ලාන්ටේෂන්ස් (පී. එල්. සී) මගින් පාලනය වන වතුවල ක්ෂේත්‍ර නිලධාරීන් ලෙස සේවය කරන ලංකා වතු සේවා සංගමයට අයත් සාමාජිකයන්ට වසර 25ක් තිස්සේ කම්කරුවන් දිනකට නෙලා ගත යුතු දළු ප්‍රමාණයට වඩා දළු නෙලීමේදී ගෙවනු ලබන දිරි දීමනාව ආයතනය විසින් ඒක පාක්ෂිකව අහිමි කිරීම නිසා එම සේවකයන්ට අසාධාරණයක් සිදුවී තිබේද? එසේ සිදු වී තිබේනම් ඔවුනට හිමිවිය යුතු සහන මොනවාද යන්න පිළිබඳව වේ. ”

අනතුරුව දෙපාර්ශවය විසින් සිය ස්ථාවරයන් සඳහන් කරමින් විස්තර ප්‍රකාශ ගොණු කරන ලදී. පළමු පාර්ශවය 2019.05.05 දින ගොනු කරන විස්තර ප්‍රකාශයේ සඳහන් කර ඇත්තේ මඩොල්සිම ප්ලාන්ටේෂන් සමාගම යටතේ ඇති වතුයාය වල සේවය කරන තම සංගමයේ සාමාජිකයන්ට වසර 25ක් තිස්සේ ගෙවන ලද දිරි දීමනාව 2018 මාර්තු මාසයේ සිට එම සමාගම විසින් ඒකපාර්ශිකව නතර කිරීමෙන් ඔවුනට මූල්‍ය පාඩුවක් සිදු වී ඇති බවය. 2019.05.09 එම සමාගම වෙනුවෙන් විස්තර ප්‍රකාශයක් ගොනු කරමින් සඳහන් කරන ලද්දේ බේරුම් කිරීමෙන් නිරවුල් කිරීමට පවතින ආරවුලක් නොමැති නිසා ඉල්ලුම්කරු සංගමයේ ඉල්ලීම නිශ්ප්‍රභා කරන ලෙසය.

කෙසේ වුවද 2020.09.04 දින මෙම නඩුව විමසීම සඳහා කැඳවූ අවස්ථාවේ ඉල්ලුම්කරුට ලැබිය යුතු අතිකාල සම්බන්ධයෙන් සවිස්තරාත්මක ලියවිල්ලක් 2 වන පාර්ශ්වය වන මඩොල්සිම ප්ලාන්ටේෂන් වෙත ලබා දීමට ඉල්ලුම්කාර පාර්ශවය එකග වූ අතර ඒ පිළිබඳව සලකා බැලීමට 2 වන පාර්ශවය එකඟ විය.

කෙසේ වුවද දෙපාර්ශවය අතර එකඟතාවයක් ඇති නොවන බව පෙනී ගියෙන් ඉල්ලුම්කාර පාර්ශවයේ සාක්ෂි කැඳවීමට තීරණය කළෙමි. ඒ අනුව 2021.03.19 දින ඉල්ලුම්කාර පාර්ශවය වෙනුවෙන් වෙරලපතන වතුයායේ ක්ෂේත්‍ර නිලධාරිවරයෙකු සාක්ෂි දෙන ලදී.

2021.12.31 වන දින වැඩිදුර විමසීමට කැඳ වූ අවස්ථාවේ ඉල්ලුම්කාර පාර්ශවය ප්‍රකාශ කර සිටියේ අතිකාල දීමනාව සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති ලේඛන හා වතුයාය වල ඇති ලේඛන සංසන්දනය කරන ලබනු බවත් වෙරලපතන වතු යායේ ක්ෂේත්‍ර නිලධාරීන්ට ගෙවීමට ඇති අතිකාල සම්බන්ධයෙන් එකඟතාවයක් ඇති වී ඇති බවය. එම කරුණු පිළිගනිමින් දෙවන පාර්ශවය ප්‍රකාශ කර සිටියේ ඉතිරි වතුයායන්හි පවත්වාගෙන යනු ලබන ලේඛණ ද ඉදිරිපත් කර කරුණු ඉදිරිපත් කිරීමට දිනයක් ලබාදෙන ලෙසය.

2022.07.26 දින මෙම නඩුව කැඳවූ අවස්ථාවේ දෙවන පාර්ශවය සඳහන් කරන ලද්දේ අදළ ගිණුම් හා පොත් පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඉල්ලුම්කරුවන්ට දිරි දීමනාව ලෙස රුපියල් පන්ලක්ෂ හැත්තෑ පන් දහස් තුන්සිය හැට හතයි ශත දහනවයක (රු.575367.19) මුදලක් ගෙවීමට තිබූ බවත් එම මුදල ඉල්ලුම්කරුවන්ට ගෙවන ලද බවත්ය. එම මුදලට එකඟවන බවත් එම මුදල ලැබුන බවත් ඉල්ලුම්කාර පාර්ශවය පිළිගන්නා ලදී.

මෙම ආරවුලට හේතු වූයේ මඩුල්සිම ප්ලාන්ටේෂන් මගින් පාලනය වන වතුයාය වල ක්ෂේත්‍ර නිලධාරින්ට ගෙවන ලද දිරි දීමනාව අහිමි කිරීමෙන් ඔවුන්ට අසාධාරණයක් සිදු වී තිබේද එසේ සිදු වී තිබේ නම් ඔවුන්ට හිමි විය යුතු සහන මොනවාද යන්නයි.

ඒ පිළිබඳව විමසීම පවතින අතර තුර දෙවන පාර්ශවය එකී දිරි දීමනා ගෙවීමට ඇති බව පිළිගෙන එය ගෙවීමත් පළමු පාර්ශවය තමන්ට ලැබිය යුතු දිරි දීමනාව රු. 575367.19 බව පිලිගැනීමත් එම මුදල දෙවන පාර්ශවයෙන් ලැබුණු බව පිළිගැනීමත් නිසා මෙම ආරවුලට හේතු වූ විමසීම අවසන් කරන ලදී.

නීතිඥ සරත් ලියනගේ,
බේරුම්කරු.

2022 සැප්තැම්බර් මස 09 වැනි දින.

EOG 10- 0135

---

මගේ අංකය: IR/COM/03/2019/03(i).

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරිය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2021.12.03 දිනැති හා අංක 2256/55 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2021.11.23 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් 1. රත්මලාන, ගාලු පාර, අංක 322/1 හි පදිංචි එන්. එල්. ඩී. පී. එච්. සාන්තරාජා මයා, සහ 2. ගල්පාත, දියගම, "ශ්‍යාමලී" හි පදිංචි ඒ.ඩී.සී. බුද්ධදාස මයා සහ කොළඹ 02, චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, අංක 50 හි පිහිටි ලංකා විදුලිබල මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.07.25 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 සැප්තැම්බර් මස 28 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කාර්මික අධිකරණයේ දී ය.

1. එන්. එල්. ඩී. පී. එච්. සාන්තරාජා මයා,
අංක 322/1, ගාලු පාර, රත්මලාන.

මගේ අංකය: IR/COM/03/2019/03(i)

බේරුම්කරණ අංකය: A /68/2021

1. ඒ. ඩී. සී. බුද්ධදාස මයා,
''ශ්‍යාමලී'', දියගම,
ගල්පාත.

*පළමු වැනි පාර්ශ්වය*

එදිරිව

ලංකා විදුලිබල මණ්ඩලය,
අංක 50, චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

*දෙවැනි පාර්ශ්වය*

අතර පවත්නා කාර්මික ආරවුල සම්බන්ධ ප්‍රදානය

කම්කරු වෘත්තිය සමිති සබඳතා ගරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාගේ 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2021/11/23 වන දිනැති නියෝගයෙන් මා පත්කොට මාවෙත යොමුකර ඇත.

වර්ෂ 2021 නොවැම්බර් මස 23 වැනි දිනැති කම්කරු කොමසාරිස් ජනරාල්තුමාගේ යොමුව පහත පරිදි දැක්වේ.

''ලංකා විදුලිබල මණ්ඩලයේ සේවය කර ඇති එන්. එල්. ඩී. පී. එච්. සාන්තරාජා මයා, ඒ.ඩී.සී. බුද්ධදාස මයා, යන සේවකයන්ට උසස්වීම් ලබා දීමේ අසාධාරණයක් සිදුව තිබේද? එසේ අසාධාරණයක් සිදු වී අත්නම් එම එක් එක් සේවකයාට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.

මෙහි පළමු පාර්ශවයට බැඳි එන්. එන්. එල්. ඩී. පී. එච්. සාන්තරාජා මයා, එ.ඩී.සී. බුද්ධදාස මයා, යන අයවළුන්ට ලංකා විදුලි බල මණ්ඩලය විසින් B.C. පෙරේරා කමිටු නිර්දේශය පරිදි 1981 වර්ෂයේ සිට 2002 වර්ෂය දක්වා කල්පිත පදනමක් මත උසස්වීම් සමඟ හිග වැටුප් ලබා දිය යුතු නමුත්, විදුලි බල මණ්ඩලය විසින් එම නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම මත මෙම දෙපාර්ශවය අතර කාර්මික ආරවුලට හේතුවී ඇත.

මෙහිදි මා විසින් කොළඹ කම්කරු අධිකරණයේ දී පවත්වනු ලැබූ ගෘහස්ත පරීක්ෂණයේ දී ප්‍රථම අවස්ථාවේ දී මෙසේ වග උත්තරකරුගේ පාර්ශ්වය වන විදුලි බල මණ්ඩලයේ කිසිම නියෝජිතයෙකු හෝ ඔවුන් වෙනුවෙන් යම්කිසි නියෝජනයක් හෝ නොතිබුණි.

හිමිකම් ලැබිය යුත්තේ වසර 03 ක කාලයක් ප්‍රමාදවීමෙන්ය. ඒ අනුව පළමු පාර්ශ්වයට ලැබිය යුතු ජෝෂ්ඨ ඉංජිනේරු සහකාර තනතුර නීත්‍යානුකුල වශයෙන් හිමි විය යුත්තේ 1993.06.01 වැනි දින බව මාගේ තීරණය වේ.

එසේම මෙහි වගඋත්තරකරුගේ ආයතනයේ පිළිතුරු ප්‍රකාශයේ 07 වන ඡේදය මගින් මෙහි පළමු පාර්ශ්වයට හිමිකම් ලැබිය යුතු තනතුර පවා ඉතාමත් අසාධාරණ ලෙස කප්පාදු කර ඇති බව මනාව පැහැදිලි වේ.

මන්ද යම් කිසි සේවා නිළධාරියෙකු විශ්‍රාම යන අවස්ථාව වන විට පිහිටුවිය යුතු තනතුරෙහි සුදුසුකම් සපුරා ඇත්නම් එකී තනතුරට පිහිටුවාලිය යුතු වේ. එකී හිමිකම් ලැබූ තනතුරු වෙතොත් කිසිදු හේතුවක් මත ලබා නොදීම දැඩිසේ මානව හිමිකම් උල්ලංගනය කිරීමකි.

එසේම වගඋත්තරකරුගේ පිළිතුරු ප්‍රකාශයේ 08 වන ඡේදයේ සඳහන් පරිදි ඔවුන් විසින් එවා ඇති R 1 දරන ලේඛනයේ මෙහි පළමු පාර්ශ්වයේ එන්.එල්.ඩී.පී.එච්.සාන්තරාජා මහතාගේ නම සඳහන්ව නොමැති බව ප්‍රකාශකර ඇති නමුත් එසේ නියමිත දතමවලට අනුකූලව සුදුසුකම් සපුරා ඇති මෙහි පළමු පාර්ශ්වයේ නම සඳහන් නොවීමට හෝ නොකිරීමට හේතු සාධක වගඋත්තරකාර ආයතනය විසින් දක්වා නොමැති බව මැනවින් ප්‍රත්‍යක්ෂ වේ.

ඒ අනුව මා හට ඉතාමත්ම පැහැදිලි ව පෙනෙනා කාරණයක් නම් B.C පෙරේරා කමිටු වාර්තාවක් කැබිනට් තීරණ අනුමැතියක් යටතේ නිකුත් කර ඇති පසුබිමක ඉතාමත් අත්තනෝමතික ආකාරයෙන් පරිපාලනයේ දුර්වලතා ද හේතු කොට ගෙන මෙම පාර්ශ්වකරුවන්ව පිහිටවිය යුතු වැටුප් තලය නැතහොත් උසස්වීම් ලබා දිය යුතු නිලතලවල නිවැරදිව එම කාල සීමාවන් තුළ පිහිටුවා නොමැති බවයි.

ඒ අනුව මෙම පාර්ශ්වකරුවන් විසින් මා වෙත ලබා දී ඇති ලිඛිත සාක්ෂි හේතුකොට ගනිමින් මා විසින් තීරණය කරනු ලබන්නේ මෙහි පළමුවන පාර්ශ්වයේ එන්.එල්.ඩී.පී.එච්. සාන්තරාජා මහතා B.C පෙරේරා කමිටු වාර්තාව අනුව හිමිකම් ලැබිය යුතු වන ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු සහකාර තනතුරට 1990.06.01 වන දින පිහිටුවිය යුතු වන බවයි.

මෙම චක්‍රලේඛ අංක 2003/GM/27 ප්‍රතිපත්ති B.C පෙරේරා කමිටු වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමෙහි (04) වන වගන්තියේ (ඈ) උප වගන්තිය ප්‍රකාර වූ මෙහි පළමු පාර්ශ්විය එන්.එල්.ඩී.පී.එච්. සාන්තරාජා මහතා ඉංජිනේරු සහකාර තනතුරට පත්වීම ලැබිය යුතු වන්නේ 1985.06.01 වන දිනට වන බැවින් එහි (04) (ඈ) වන වගන්තිය ප්‍රාකාර ව.

**"කල්පිත ව ඉංජිනේරු සහකාර තනතුරට උසස් වූ නිලධාරි ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු සහකාර තනතුරේ අවුරුදු 05 ක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් හා අදළ කාර්යක්‍ෂමතා කඩඉම ..............................................."**

ලෙස නිර්දේශ කරනු ලැබ ඇත. ඒ අනුව පළමු පාර්ශ්විය එන්.එල්.ඩී.පී.එච්.සාන්තරාජා මහතා නිවැරදි තනතුරෙහි එනම් 1985.06.01 වන දිනට ඉංජිනේරු සහකාර තනතුරට උසස්වීම් කරනු ලැබිය යුතුය. එසේ උසස්වීම් ලැබුවේ නම් එදින සිට අවුරුදු 05 ක සේවා කාලය සම්පූර්ණ කරනු ලබන 1990.06.01 වන දිනට ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු තනතුරට උසස්වීම් කරනු ලැබිය යුතුය.

වැඩ තහනමට ලක් කිරීම හේතුකොට පළමු පාර්ශවය නැවත උසස්වීම එනම් ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු සහකාර තනතුරට නිත්‍යානුකූලව හිමිකම් ලබනු ඇත්තේ 1993.06.01 වන දින වේ.

මෙහි දෙවන වග උත්තරකාර පාර්ශ්වය වන ලංකා විදුලිබල මණ්ඩලය විසින් 2022.02.23 වන දිනැති උත්තරවාදයේ ඇමුණුම් R 01 වශයෙන් සඳහන් ඔවුන් විසින් ලැයිස්තුගත කර ඇති ලේඛනයේ මෙම පාර්ශ්වකරු හා සමානවම සුදුසුකම් සපුරා ලූ පුද්ගලයින් කීප දෙනෙකුට ද පත්වීම් උසස්කර ලබා දී ඇති බව පෙනී යයි.

ඉන් පසුව වර්ෂ 2022 ක් වූ පෙබරවාරි මස 23 වන දින වගඋත්තරකරුගේ පාර්ශවය වන ලංකා විදුලි බල මණ්ඩලය විසින් මෙහි පළමු පාර්ශවකරු වන එන්.එල්.ඩී.පී.එච්. සාන්තරාජා මහතා වෙනුවෙන් පමණක් උත්තරවාද ගොනු කොට තිබුණි. එබැවින් දෙපාර්ශවයේම කරුණු සලකා බැලීමට තීරණය කරමි.

මෙහිදී වගඋත්තරකරුගේ පාර්ශවය විසින් එවන ලද පිළිතුරු ප්‍රකාශයේ 04 වන ඡේදයේ සටහන් පරිදි මෙහි පළමු පාර්ශවකරු වන එන්.එල්.ඩී.පී.එච්.සාන්තරාජා මහතා 1989.10.19 වැඩ තහනමකට ලක්කර ඇති බව සඳහන් කර ඇත.

ඒ අනුව එකී වැඩ තහනමට ලක්වන අවස්ථාව වන විට B.C පෙරේරා කමිටු වාර්තාවේ උසස්වීම් සඳහා හිමිකම් ලැබීමට දතම සකස් කරනු ලැබූ ලැයිස්තුව අනුව එම මහතා 1985.06.01 වන දින විදුලි ඉංජිනේරු සහකාර තනතුර ලැබීමට සුදුසුකම් ලබා ඇති බව පෙනී යයි. එකී ලැයිස්තුව අනුව 1989.10.19 වන දින වන විට පළමු පාර්ශ්වයේ එන්.එල්.ඩී.පී.එච්. සාන්තරාජා මහතා 1985.06.01 වන දින විදුලි ඉංජිනේරු සහකාර තනතුර ලබා තිබිය යුතු වන අතර එකී තනතුරේ වසර 04 කුත් සහ මාස 04 කුත් පූර්ණ කරනු ලැබ ඇත.

ඒ අනුව නැවත සේවයේ සක්‍රීයව පිහිටුවනු ලැබූ දින වන 1990.09.25 වන දින වන විට පළමු පාර්ශවය විසින් විදුලි ඉංජිනේරු සහකාර තනතුරේ පිහිටුවා එම තනතුරේ වැඩ භාර ගත යුතුව ඇත.

මෙහි වගඋත්තරකරුගේ පාර්ශවය වන ලංකා විදුලිබල මණ්ඩලය විසින් එවන ලද පිළිතුරු ප්‍රකාශයේ සේවා තනතුරුවල දතම පිළිබඳව ප්‍රශ්ණයක් පැන නැගේ.

මන්ද වගඋත්තරකාර පාර්ශවය විසින් එවන ලද පිළිතුරු ප්‍රකාශයේ 05 වන ඡේදයේ සඳහන් කරනු ලැබ ඇත්තේ පළමු පාර්ශවය වැඩ තහනමට ලක්කර නැවත සේවයේ පිහිටුවනු ලැබූ 1990.09.25 වන දිනට පසු වර්ෂ 03 ක කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව උසස්වීම් සලකා බැලිය යුතු බවයි.

ඔවුන් විසින් සඳහන් කරනු ලැබ ඇත්තේ ඒ අනුව පළමු පාර්ශ්වයේ එන්.එල්.ඩී.පී.එච්. සාන්තරාජා මහතා ව 1999.12.14 වන දින විදුලි අධිකාරි 1 වන පන්තියට උසස් කරනු ලැබූ බවයි.

වගඋත්තරකරුගේ පාර්ශවය විසින් සඳහන් කරනු ලැබූ පරිදි වැඩ තහනමකට යටත් එසේම වැටුප් වර්ධකයක් විලම්භනය කරනු ලැබ ඇති පළමු පාර්ශ්වය වන එන්.එල්.ඩී.පී.එච්. සාන්තරාජා මහතා උසස්වීමකට හිමිකම් ලැබීමට නැවත සේවයේ පිහිටුවනු ලැබී දින සිට වසර 03 ක කාලයක් සේවයේ නියුතු විය යුතු වන්නේ නම් ඒ අනුව ද වගඋත්තරකරුගේ පාර්ශ්වය විසින් සේවයේ පිහිටුවනු ලැබූ විදුලි අධිකාරි සේවයේ පිහිටුවිය යුත්තේ 1993/09/25 විය යුතු වේ.

ඒ අනුව වගඋත්තරකාර ආයතනය විසින් මෙහි පළමුවන පාර්ශවය වෙනුවෙන් එවන ලද පිලිතුරු ප්‍රකාශයේ සේවා නිල කාල සීමා පරාසය පිළිබඳ අතිශය සාවද්‍ය තොරතුරු ගොනු කර එවා ඇති බව ප්‍රත්‍යක්ෂ වේ.

ඒ අනුව දෙපාර්ශ්වයේම කරුණු සලකා බැලීමේ දී මෙහි පළමු වන පාර්ශ්වයේ එන්.එල්.ඩී.පී.එච්. සාන්තරාජා මහතා බලවත් අසාධාරණයකට ලක් වී ඇති බව මනාව පැහැදිලි වේ.

ඒ අනුව චක්‍ර ලේඛණ අංක 2003/GM/27 ප්‍රතිපත්ති දරන චක්‍රලේඛය මගින් B.C පෙරේරා කමිටු වාර්තාව අනුව උසස්වීම් ලැබීමට හිමිකම් ලැබූ දතම ලැයිස්තුවට අනුව පළමු පාර්ශ්වයේ එන්.එල්.ඩී.පී.එච්. සාන්තරාජා මහතා හට ඉංජිනේරු සහකාර තනතුර ලැබිය යුත්තේ 1985.06.01 වන දින වේ.

ඒ අනුව එකී උසස්වීම් ලැබීමට හිමිකම් තිබූ දතම ලැයිස්තුව අනුව පළමු පාර්ශ්වයට ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු සහකාර තනතුරට උසස්වීම් ලැබීමට හිමිකම් ලබන දිනය වන්නේ 1990.06.01 වන දින වේ.

නමුත් එකී උසස්වීම් ලැබීමට යම් ප්‍රමාදයක් ලෙස වගඋත්තරකරුගේ පිළිතුරු ප්‍රකාශයේ සඳහන් කර ඇති පරිදි පළමු පාර්ශ්වයේ වැඩ තහනමකට ලක් කිරීමක් කර ඇති බැවින් ඉන් පසු උසස්වීමකට

ඒ අනුව එක් කොටසකට වෙන්ව සැලකීම ස්වභාවික යුක්ති මූලධර්මයට පටහැනි බව මාගේ තීරණය වේ.

එසේම , <u>ආයතන සංග්‍රහයේ 02 වන පරිච්ඡේදයේ 06 වන වගන්තිය ප්‍රකාර වූ උසස්වීම් ක්‍රමයත් අදාළ පත්වීමක සිටින නිලධාරියෙකු උසස්වීම් දීමේ ප්‍රමාදය මත විශ්‍රාම ගැනීමේ හේතුව මත එකී උසස්වීම් අහිම කළ නොහැකි බවයි.</u>

ඒ අනුව සියලුම ලේඛනගත සාක්ෂි මැනවින් සලකා බලා මාගේ තීරණය මෙසේ ප්‍රදනය කරමි.

## ප්‍රදානය

ඉහත විශ්ලේශණයෙන් අනතුරුව එකල විදුලිබල හා බලශක්ති අංශ අමාත්‍ය ධූරය හෙබ වූ කරු ජයසූරිය මහතා ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය විසින් අනුමත කළ 2003/GM/27 ප්‍රතිපත්ති B.C පෙරේරා කමිටු වාර්තාව අනුව මෙහි පලමු පාර්ශ්විය එන්.එල්.ඩී.පී.එච්. සාන්තරාජා මහතා ට 1985.06.01 වන දිනට ඉංජිනේරු සහකාර තනතුරෙහි පිහිටුවා එකී වාර්තාවේ (04) (ඈ) වන උප වගන්තිය ප්‍රකාරව එකී ඉංජිනේරු සහකාර තනතුරෙහි අවුරුදු 05 සම්පූර්ණ කර ඇති බැවින් එන්.එල්.ඩී.පී.එච්. සාන්තරාජා මහතා 1990.06.01 වන දින ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු සහකාර තනතුරෙහි පිහිටුවිය යුතුය.

නමුත් පළමු පාර්ශ්වීය එන්.එල්.ඩී.පී.එච්. සාන්තරාජා මහතා වැඩ තහනමකට ලක්වීම හේතුවෙන් උසසවීම් ලැබීමට වසර 03 ක කාලයක පසු කළ යුතු වීම හේතුවෙන් නිත්‍යානුකූල ව පළමු පාර්ශ්විය එන්.එල්.ඩී.පී.එච්.සාන්තරාජා මහතාට ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු සහකාර තනතුර හිමිවිය යුත්තේ 1993.06.01 වන දින වේ.

එ අනුව වර්ෂ 1993.06.01 වන දින සිට එකී ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු සහකාර තනතුරෙහි පිහිටුවා ඊට අදළ වැටුප් තලය අනුව එන්.එල්.ඩී.පී.එච්. සාන්තරාජා මහතාට 2003.12.19 වන දින විශ්‍රාම ලබන අවස්ථාව වන විට ඔහු හිමිකම් ලැබිය යුතු නිවැරදි වැටුප් තලයේ පිහිටුවා ඔහුට හිමි නිවැරදි විශ්‍රාම වැටුප ලැබීමට ඔහු නෛතික වශයෙන් හිමිකම් ලබා ඇති බැවින් එකී විශ්‍රාම වැටුප ගෙවන මෙන් නියෝග කරමි.

තවද මෙම ප්‍රදානය *ගැසට් පත්‍රයේ* පළ වීමෙන් මාස 03 ක් ඇතුලත දකුණු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කළ යුතු වේ. ඒ අනුව තැන්පත් කළ යුතු සම්පූර්ණ මුදල වන්නේ දෙලක්ෂ විසි පන් දහසක (225,000/-) ක මුදලකි.

වෙනත් ව්‍යවස්ථාපිත දීමනා සඳහා හිමිකමක් නොමැත.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව සහතික කරමි.

බේරුම්කරු
එම්. ඒ. ජී. හෙරේෂා ක්‍රිස්ටීන්.

2022 ජූලි මස 25 වැනි දින.

**කාර්මික අධිකරණයේ දී ය.**

1. එන්. එල්. ඩී. පී. එච්. සාන්තරාජා මයා,
අංක 322/1, ගාලු පාර, රත්මලාන.

මගේ අංකය: IR/COM/03/2019/03(i)

බේරුම්කරණ අංකය: A /68/2021

1. ඒ. ඩී. සී. බුද්ධදාස මයා,
''ශ්‍යාමලී'', දියගම,
ගල්පාත.

*පළමු වැනි පාර්ශ්වය*

එදිරිව

ලංකා විදුලිබල මණ්ඩලය,
අංක 50, චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

*දෙවැනි පාර්ශ්වය*

**අතර පවත්නා කාර්මික ආරාවුල සම්බන්ධ ප්‍රදානයට අදළ එන්. එල්. ඩී. පී. එච්. සාන්තරාජා මහතාගේ සේවා කළ යුතු කාලය හා වන්දි මුදල පිළිබඳ උපලේඛණය**

එන්. එල්. ඩී. පී. එච්. සාන්තරාජා මහතා

| | | |
|---|---|---|
| 2000 වර්ෂය | මසකට | රු. 6,000 X 12 |
| | වර්ෂයකට | රු. 72,000 |
| 2001 වර්ෂය | මසකට | රු. 6,250 X 12 |
| | වර්ෂයකට | රු. 75,000 |
| 2002 වර්ෂය | මසකට | රු. 6,500 X 12 |
| | වර්ෂයකට | රු. 78,000 |

ඒ අනුව ගෙවිය යුතු සම්පූර්ණ මුදල වන්නේ දෙලක්ෂ විසි පන් දහසක (225,000/-) ක මුදලකි.

2022 ජූලි මස 25 වැනි දින.

බේරුම්කරු
එම්. ඒ. ජී. හෙරේෂා ක්‍රිස්ටීන්.

**කාර්මික අධිකරණයේ දී ය.**

1. එන්. එල්. ඩී. පී. එච්. සාන්තරාජා මයා,
අංක 322/1, ගාලු පාර, රත්මලාන.

මගේ අංකය: IR/COM/03/2019/03(i)

බේරුම්කරණ අංක: A /68/2021

1. ඒ. ඩී. සී. බුද්ධදාස මයා,
''ශ්‍යාමලී'', දියගම,
ගල්පාත.

*පළමු වැනි පාර්ශ්වය*

එදිරිව

ලංකා විදුලිබල මණ්ඩලය,
අංක 50, චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

*දෙවැනි පාර්ශ්වය*

**අතර පවතින කාර්මික ආරවුල සම්බන්ධ ප්‍රදානය**

කම්කරු වෘත්තීය සමිති සබඳතා ගරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාගේ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු 2021.11.23 වැනි දිනැති නියෝගයෙන් මා පත්කොට මා යොමු කර ඇත.

වර්ෂ 2021 නොවැම්බර් මස 23 වැනි දිනැති කම්කරු කොමසාරිස් ජනරාල්තුමාගේ යොමුව පහත පරිදි දැක්වේ.

''ලංකා විදුලිබල මණ්ඩලයේ සේවය කර ඇති එන්. එල්. ඩී. පී. එච්. සාන්තරාජා මයා, ඒ. ඩී. සී. බුද්ධදාස මයා, යන සේවකයින්ට උසස්වීම් ලබාදීමේ දී අසාධාරණයක් සිදුව තිබේ ද? එසේ අසාධාරණයක් සිදු වී ඇත්නම් එම එක් එක් සේවකයාට හිමිවිය යුතු සහනයන් කවරේ ද? යන්න පිළිබඳව වේ.

මෙහිදී පළමු පාර්ශවයට බැඳි එන්. එල්. ඩී. පී. එච්. සාන්තරාජා මයා සහ ඒ. ඩී. සී. බුද්ධදාස මයා යන අයවලුන්ට ලංකා විදුලිබල මණ්ඩලය විසින් B. C පෙරේරා කමිටු නිර්දේශය පරිදි 1981 වර්ෂයේ සිට 2002 වර්ෂය දක්වා කල්පිත පදනමක් මත උසස්වීම් සමග හිඟ වැටුප් ලබාදිය යුතු නමුත්, විදුලිබල මණ්ඩලය විසින් එම නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම මත මෙම දෙපාර්ශවය අතර කාර්මික ආරාවුලට හේතු වී ඇත.

මුල් අවස්ථාවේ දී 2022.02.17 වැනි දින පෙ.ව. 10.45 ට කාර්මික අධිකරණයේ දී පළමු පාර්ශවයේ පළමුවන පාර්ශවය ද, පළමු වන පාර්ශවයේ දෙවන පාර්ශවය වෙනුවෙන් ඔහුගේ සොහොයුරු වන නීතිඥ B. P. S. P. කසීලාල් මහතා පෙනී සිටි අතර, දෙවන පාර්ශවය හෝ එකී දෙවන වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් නියෝජනයන් හෝ නොතිබුණි.

පළමු පාර්ශවයේ ඉල්ලුම්කරුවන් දෙදෙනාම ඔවුන්ට බී. සී. පෙරේරා කමිටු වාර්තාව අනුව ඔවුන්ට ලැබිය යුතු උසස්වීම් නොලැබුණු බවට ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයට එරෙහිව චෝදනා නගා ඇත. මෙහි පළමු පාර්ශවයේ පළමු වන සහ දෙවන

ඉල්ලුම්කරුවන්ට බී. සී. පෙරේරා කමිටු වාර්තාව අනුව උසස්වීම් සහිත හිඟ වැටුප් ලබා නොදීම හේතුවෙන් කම්කරු කොමසාරිස්තුමා වෙත පැමිණිලි ඉදිරිපත් කර ඇත.

මෙහි වගඋත්තරකාර පාර්ශවය වන විදුලිබල මණ්ඩලය වෙත මා විසින් පාර්ශවකරුවන් දෙදෙනා වෙනුවෙන් වගඋත්තර පිළිතුරු ප්‍රකාශ අවසන් වශයෙන් ඉදිරිපත් කරනා ලෙස 2022.03.31 වැනි දින ලබා දී තිබූ අතර, මෙතෙක් මා වෙත ලැබීමට කටයුතු කර නොමැත.

එබැවින් දෙපාර්ශවයේම කරුණු සලකා බැලීමට තීරණය කරමි. මෙහිදී විදුලිබල මණ්ඩලය විසින් මෙහි එක් පාර්ශවයකට පමණක් පිළිතුරු ප්‍රකාශයක් ඉදිරිපත් කර තිබූ අතර, අනෙක් පාර්ශවය සම්බන්ධයෙන් පිළිතුරු ප්‍රකාශයක් එවන මෙන් ඉල්ලා සිටියත්, කිසිඳු පිළිතුරු ප්‍රකාශයක් මේ වන තෙක් ඉදිරිපත් කර නොමැත. එසේම මා විසින් පවත්වන ලද මූලික විමසීමට පවා සහභාගි නොවූ අතර, නියෝජනයක් හෝ නොතිබුණි. එම නිසා මෙය ඒකපාර්ශ්විකව තීන්දු කිරීමට මා තීරණය කරමි.

මෙහිදී චක්‍රලේඛ අංක 2003/GM/27 ප්‍රතිපත්ති දරන චක්‍රලේඛ මගින් BC පෙරේරා කමිටු වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම වර්ෂ 1981.01.01 වැනි දින සිට කල්පිත පදනමක් මත විදුලි/යාන්ත්‍රික සිවිල් අධිකාරිවරුන්ට උසස්වීම් ප්‍රදානය කිරීම කර ඇත.

මෙම BC පෙරේරා කමිටු තීරණය ක්‍රියාත්මක විය යුත්තේ වර්ෂ 1981 සිට 2002 වර්ෂය දක්වා කාල පරාසය තුළ විදුලි අධිකරිවරුන් වශයෙන් සක්‍රීය සේවයේ යෙදීම නිසා උසස්වීම් විභාගවලට පෙනී සිටීමට නොහැකි වූ විදුලි අධිකාරිවරුන් වෙනුවෙන් වේ.

ඒ අනුව BC පෙරේරා කමිටු වාර්තාවේ උසස්වීම් සඳහා හිමිකම් ලැබීමට දාතම සකස් කරනු ලැබූ වාර්තාවේ අංක 28 යටතේ මෙම නඩුවේ පළමුවන පාර්ශවයේ නම් සඳහන් ඒ. ඩී. සී. බුද්ධදාස මහතා 1987.01.01 වැනි දින වන විට විදුලි අධිකාරි 1 පන්තිය ලැබී ඇත.

ඒ අනුව BC පෙරේරා කමිටු වාර්තාව අනුව ඒ. ඩී. සී. බුද්ධදාස මහතාට ලැබිය යුතු ඉංජිනේරු සහකාර තනතුර හිමිවිය යුත්තේ 1991.01.01 වැනි දිනට වේ.

නමුත් මෙවැනි චක්‍රලේඛයක් නිකුත් කර තිබියදීත් එය සක්‍රියව ක්‍රියාත්මක කරවීමේ යම් යම් අඩුපාඩු පරිපාලනයේ දුර්වලතා හේතු කොටගෙන මෙම පාර්ශවකරුවන්ට යම්කිසි බලවත් අසාධාරණයකට ලක් වී ඇති බව ඉතාමත් ප්‍රත්‍යක්ෂ කාරණයකි.

නමුත් මෙහිදී මෙම පළමු වන පාර්ශවකරුවකු වන ඒ. ඩී. සී. බුද්ධදාස මහතා විදුලි අධිකාරි 1 සේවයේ සිට ඉංජිනේරු සහකාර තනතුරට උසස් කිරීම කරනු ලැබ ඇත්තේ 2002.09.11 වැනි දින සිට බවට පසු දාතම ඇති බව ලිඛිත සාක්ෂි මගින් පෙනී යයි.

නමුත් මා වෙත මේ වන තුරු මෙහි දෙවන වගඋත්තරකාර පාර්ශ්වය වන ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය විසින් හෝ එම ආයතනයේ නියෝජිතයෙකු මාර්ගයෙන් හෝ එකී කාරණයට උත්තරවාද එවා නොමැත.

ඒ අනුව මා හට ඉතාමත් ම පැහැදිලි ව පෙනෙන කාරණයක් නම් BC පෙරේරා කමිටු වාර්තාවක් කැබිනට් තීරණ අනුමැතියක් යටතේ නිකුත් කර ඇති පසුබිමක ඉතාමත් අත්තනෝමතික ආකාරයෙන් පරිපාලනයේ දුර්වලතා ද හේතුකොට ගෙන මෙම පාර්ශ්වකරුවන්ව පිහිටවිය යුතු වැටුප් තලය නැතහොත් උසස්වීම් ලබා දිය යුතු නිලතලවල නිවැරදි ව එම කාල සීමාවන් තුළ පිහිටුවා නොමැති බවයි.

ඒ අනුව මෙම පාර්ශ්වකරුවන් විසින් මා වෙත ලබා දී ඇති ලිඛිත සාක්ෂි හේතුකොට ගනිමින් මා විසින් තීරණය කරනු ලබන්නේ මෙහි පළමු වන පාර්ශ්වයේ ඒ. ඩී. සී. බුද්ධදාස මහතා BC පෙරේරා කමිටු වාර්තාව අනුව හිමිකම් ලැබිය යුතු වන ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු සහකාර තනතුරට 1996.01.01 වැනි දින පිහිටවිය යුතු වන බවය.

මෙය චක්‍රලේඛ අංක 2003/GM/27 ප්‍රතිපත්ති BC පෙරේරා කමිටු වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමෙහි (04) වන වගන්තියේ (ඇ) උප වගන්තිය ප්‍රකාර වූ මෙහි පළමු වන පාර්ශ්වීය ඒ. ඩී. සී. බුද්ධදාස මහතා ඉංජිනේරු සහකාර තනතුරට පත්වීම ලැබිය යුතු

වන්නේ 1991.01.01 වැනි දින වන බැවින් එහි (04) (ඇ) වන වගන්තිය ප්‍රකාර ව

''කල්පිත ව ඉංජිනේරු සහකාර තනතුරට උසස් වූ නිලධාරි ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු සහකාර තනතුරේ අවුරු 05 ක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් හා අදාල කාර්යක්‍ෂමතා කඩඉම.............''

ලෙස නිර්දේශ කරනු ලැබ ඇත. ඒ අනුව පළමු පාර්ශ්වීය ඒ. ඩී. සී. බුද්ධදාස මහතා නිවැරදි තනතුරෙහි එනම් 1991.01.01 වැනි දිනට ඉංජිනේරු සහකාර තනතුරට උසස්වීම් කරනු ලැබිය යුතුය.

මෙහි දෙවන වගඋත්තරකාර පාර්ශ්වය වන ලංකා විදුලිබල මණ්ඩලය විසින් 2022.02.23 වැනි දිනැති උත්තරවාදයේ ඇමුණුම් R 01 වශයෙන් සඳහන් ඔවුන් විසින් ලැයිස්තුගත කර ඇති ලේඛනයේ මෙම පාර්ශ්වකරු හා සමානව ම සුදුසුකම් සපුරා ලූ පුද්ගලයින් කීප දෙනෙකුට ද පත්වීම් උසස්කර ලබා දී ඇති බව පෙනී යයි.

ඒ අනුව එක් කොටසකට වෙනස් ව සැලකීම ස්වභාවික යුක්ති මූලධර්මයට පටහැනි බව මාගේ තීරණය වේ.

එසේම, ආයතන සංග්‍රහයේ 02 වන පරිච්ඡේදයේ 06 වන වගන්තිය ප්‍රකාර වූ උසස්වීම් ක්‍රමයත් අදාළ පත්වීමක සිටින නිලධාරියෙකු උසස්වීම් දීමේ ප්‍රමාදය මත විශ්‍රාම ගැනීමේ හේතුව මත එකී උසස්වීම් අහිමි කළ නොහැකි බවයි.

ඒ අනුව සියලුම ලේඛනගත සාක්ෂි මැනවින් සලකා බලා මාගේ තීරණය මෙසේ ප්‍රදානය කරමි.

## ප්‍රදානය

ඉහත විශ්ලේශනයෙන් අනතුරුව එකල විදුලිබල අමාත්‍ය ධූරය හෙබ වූ කරුජයසූරිය මහතා ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය විසින් අනුමත කළ 2003/GM/27 ප්‍රතිපත්ති BC පෙරේරා කමිටු වාර්තාව අනුව මෙහි පළමු පාර්ශ්වීය ඒ. ඩී. සී. බුද්ධදාස මහතාට 1991.01.01 වැනි දිනට ඉංජිනේරු සහකාර තනතුරෙහි පිහිටුවා එකී වාර්තාවේ (04) ඇ වන උප වගන්තිය ප්‍රකාර ව එකී ඉංජිනේරු සහකාර තනතුරෙහි අවුරුදු 05 සම්පූර්ණ කර ඇති බැවින් ඒ. ඩී. සී. බුද්ධදාස මහතා 1996.01.01 වැනි දින ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු සහකාර තනතුරෙහි පිහිටුවිය යුතු ය.

ඒ අනුව වර්ෂ 1996.01.01 වැනි දින සිට එහි ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු සහකාර තනතුරෙහි පිහිටුවා ඊට අදාල වැටුප් තලය අනුව ඒ. ඩී. සී. බුද්ධදාස මහතාට 2005.11.10 වැනි දින විශ්‍රාම ලබන අවස්ථාව වන විට ඔහු හිමිකම් ලැබිය යුතු නිවැරදි වැටුප් තලයේ පිහිටුවා ඔහුට හිමි නිවැරදි විශ්‍රාම වැටුප ලැබීමට ඔහු නෛතික වශයෙන් හිමිකම් ලබා ඇති බැවින් එකී විශ්‍රාම වැටුප ගෙවන මෙන් නියෝග කරමි. තව ද, මෙම නියෝගය *ගැසට් පත්‍රයේ* පළ වී මසක් ඇතුළත ගෙවා නිම කිරීමට ද නියෝග කරමි.

තව ද මෙම ප්‍රදානය *ගැසට් පත්‍රයේ* පළ වීමෙන් මාස 03ක් ඇතුළත දකුණු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කළ යුතු වේ. ඒ අනුව තැන්පත් කළ යුතු සම්පූර්ණ මුදල වන්නේ හාර ලක්ෂ හැත්තෑ හත් දහස (රු. 477,000/-) ක මුදලකි.

වෙනත් ව්‍යවස්ථාපිත දීමනා සඳහා හිමිකමක් නොමැත.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව සහතික කරමි.

2022 ජූලි මස 25 වැනි දින.

බේරුම්කරු,
එම්. ඒ. ජී. හෙරේෂා ක්‍රිස්ටීන්.

**කාර්මික අධිකරණයේ දී ය.**

1. එන්. එල්. ඩී. පී. එච්. සාන්තරාජා මයා,
   අංක 322/1, ගාලු පාර, රත්මලාන.

මගේ අංකය: IR/COM/03/2019/03(i)

බේරුම්කරණ අංකය: A /68/2021

1. ඒ. ඩී. සී. බුද්ධදාස මයා,
   ''ශ්‍යාමලී'', දියගම,
   ගල්පාත.

*පළමු වැනි පාර්ශ්වය*

එදිරිව

ලංකා විදුලිබල මණ්ඩලය,
අංක 50, චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

*දෙවැනි පාර්ශ්වය*

**අතර පවතින කාර්මික ආරවුල සම්බන්ධ ප්‍රදානයට අදාල ඒ. ඩී. සී. බුද්ධදාස මහතාගේ සේවා කළ යුතු කාලය හා වන්දි මුදල පිළිබඳ උපලේඛනය**

| | | | | | |
|---|---|---|---|---|---|
| ඒ. ඩී. සී. බුද්ධදාස මහතා | - | 2000 වර්ෂය | - | මසකට | රු. 6,000 × 12 |
| | | | | වර්ෂයකට | රු. 72,000 |
| | | 2001 වර්ෂය | - | මසකට | රු. 6,250 × 12 |
| | | | | වර්ෂයකට | රු. 75,000 |
| | | 2002 වර්ෂය | - | මසකට | රු. 6,500 × 12 |
| | | | | වර්ෂයකට | රු. 78,000 |
| | | 2003 වර්ෂය | - | මසකට | රු. 6,750 × 12 |
| | | | | වර්ෂයකට | රු. 81,000 |
| | | 2004 වර්ෂය | - | මසකට | රු. 7,000 × 12 |
| | | | | වර්ෂයකට | රු. 84,000 |
| | | 2005 වර්ෂය | - | මසකට | රු. 7,250 × 12 |
| | | | | වර්ෂයකට | රු. 87,000 |

ඒ අනුව ගෙවිය යුතු සම්පූර්ණ මුදල වන්නේ හාර ලක්ෂ හැත්තෑ හත් දහස (රු. 477,000/-) ක මුදලකි.

2022 ජූලි මස 25 වැනි දින.

බේරුම්කරු,
එම්. ඒ. ජී. හෙරේෂා ක්‍රිස්ටීන්.

EOG 10 - 0136

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.